# අධ්‍යාපන අමාත්‍යාංශය තාක්ෂණ අධ්‍යාපන ශාඛාව


## අ.පො.ස (සා.පෙළ) විභාගයට අදාළ පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2020

| නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II | 89 | S | I,II |
|---|---|---|---|

උපදෙස් :

- පළමු වැනි ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. ලී අල්ලුවක සමාංශක පෙනුම පහත රූපයේ දක්වා ඇත. මෙම රූපයේ A දෙසින් බලා ඉදිරි පෙනුමද, B දෙසින් බලා පැති පෙනුමද, C දෙසින් බලා සැලැස්මද තෙවන කෝණ ප්‍රක්ෂේපන මූලධර්මයට අනුව 1:1 පරිමාණයට අනුව ඇඳින්න.




සම්මත රාමුව අවශ්‍ය නොවේ. නිවැරදිව මාන යෙදිය යුතුය.

| | |
|---|---|
| නිවැරදිව පෙනුම් ස්ථානගත කිරීම | ලකුණු 12 (ලකුණු 4 බැගින්×3) |
| නිවැරදිව පෙනුම් නම් කිරීම | ලකුණු 3 (ලකුණු 1 බැගින්×3) |
| සැඟි රේඛා සඳහා | ලකුණු 2 (ලකුණු 1 බැගින්×2) |
| නිවැරදි මාන යෙදීම් සඳහා | ලකුණු 3 (ලකුණු 1 බැගින්×3) |

02. i ගිනි ත්‍රිකෝණය ඇඳ නම් කරන්න. (ලකුණු 3)


ii ප්‍රාථමික ගිනි නිවීමේ උපකරණ තුනක් (03) නම් කරන්න.(ලකුණු 3)

iii සි වර්ගයේ ගිනි කුමක්දැයි හඳුන්වා එම ගින්න නිවීම සඳහා භාවිතා කල යුතු උපක්‍රමය හා පියවර දක්වන්න.

(ලකුණු 4)

03. I. එන්ජිමක සිසිලන පද්ධතියේ අවශ්‍යතාව කුමක්ද? (ලකුණු 3)

ii රූපයේ දැක්වෙන උපාංගය හඳුන්වා එයින් සිදුවන කාර්යය පැහැදිලි කරන්න. (ලකුණු 4)



iii. ක්‍රියාකාරී එන්ජිමක ජලය නැටීමට (boiling) බලපාන හේතු තුනක් ලියන්න. (ලකුණු3)

04. I. පටි එළවුම් ජව සම්ප්‍රේශනය කිරීම සඳහා භාවිතා කරන පටි වර්ග තුනක් ලියන්න (ලකුණු 3)

ii ගියර් රෝද එළවුම් ක්‍රමය අයත් එළවුම් ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 3)

iii. ද්‍රව සම්පීඩන බල සම්ප්‍රේෂණ ක්‍රමය තුල දක්නට ඇති විශේෂ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 4)

05. i. තුනී ලෝහ තහඩු නිෂ්පාදනය ව්‍යාප්තවීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 3)

ii. ආලේපිත ලෝහ තහඩු වර්ග හතරක් ලියන්න. (ලකුණු 2)

iii. පිරිසිදු ලෝහ හෙවත් මූලික ලෝහ වර්ග හතරක් ලියන්න. (ලකුණු 2)

iv. තුනි ලෝහ තහඩු එකිනෙක සම්බන්ධ කිරීමට භාවිතා කරන උපක්‍රම තුනක් ලියන්න. (ලකුණු 3)

06. i. වෙල්ඩින් කිරීමේ ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 3)

ii. ස්‍යාන්ද (Flux) මඟින් ඉටුවන මෙහෙයන් තුනක් ලියන්න. (ලකුණු 3)

iii. සුරත් වෙල්ඩිම (right hand welding) කුමක් දැයි හඳුන්වා, එම වෙල්ඩිම භාවිත කරන අවස්ථවක් ලියන්න.

(ලකුණු 4)

07. i. ලෝහ පෘෂ්ඨ නිමහම් කිරීමේ ඇති වාසි තුනක් ලියන්න. (ලකුණු 3)

ii. ලෝහ සඳහා යොදන නිමහම් ක්‍රම හතරක් ලියන්න. (ලකුණු 4)

iii. ලෝහ වර්ණ ගැන්වීමේදි විවිධ රසායනික ද්‍රව්‍ය යොදා ගැනීමට හේතු තුනක් ලියන්න. (ලකුණු 3)